# වත්මන් අර්බුදයේ දුටු නුදුටු පැති

**ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය දෙස බලන්න. පසුගිය කාලෙ කොටි පැරදවීම සඳහා අපි ගත්ත ක්‍රියාමාර්ග නිසා නේද අද මේ තරම් බරපතල මට්ටමකට කොටි දුර්වල කරන්න පුළුවන් වෙලා තියෙන්නේ. අපි මෑත කාලෙ උදාහරණ කිහිපයක් කියන්නම්. 2002 පෙබරවාරි රනිල් - ප්‍රභා ගිවිසුම" අත්සන් කරලා රට බෙදීමේ දිශාවට යනවිට සන්ධානය හදලා, එක්සත් ජාතික පක්ෂය පරදවලා, සටන්විරාම ගිවිසුම අහෝසි වන තැනට දේශපාලනය පෙළ ගැස්සුවේ කවුද? ජනතා විමුක්ති පෙරමුණේ අපි.**

ශ්‍රී ලංකාව සිය ඉතිහාසය තුළ ඉතා තියුණු හැරවුම් ලක්ෂයකට පැමිණ තිබේ. එක් අතකින් ආර්ථිකය විශාල අර්බුදයකට ගොදුරුවී ඇත. ජනතාවට සිය දෛනික ජීවිතය පවත්වාගෙන යාම පවා අසීරුවන තරමට අර්බුදය උග්‍රවී ඇත. මේවන විටත් ලංකාව කලාපයේ රටවල් අතර වැඩිම උද්ධමන ප්‍රතිශතය වාර්තා කරමින් සිටී.

ඒ අතර කොටි ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය තොරම්බල් කරමින් බෙදුම්වාදය වෙනත් පැත්තකින් ශක්තිමත් කිරීමේ උත්සාහයක් සූක්ෂම ලෙස දියත් වෙමින් පවතී. අප රට සිය ආර්ථික හා දේශපාලන යටත්විජිතයක් බවට පත්කර ගැනීම සඳහා ඉන්දියාව ප්‍රමුඛ කලාපීය බලවත්තුද, ඇමරිකා එක්සත් ජනපදය හා බටහිර යුරෝපීය අධිරාජ්‍යවාදීහුද කැස කවමින් සිටිති. ඒ සඳහා ඔවුහු විවිධාකාරයෙන් අප රටට බලපෑම් කරමින් සිටිති.

මෙවැනි සංකීර්ණ සන්දර්භයක් තුළ වමේ ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය අතිශය ප්‍රවේශමෙන් තෝරාගත යුත්තකි. මෙම අර්බුදය හමුවේ සංවේදීත්වය හා අරගල කාරීත්වය වර්ධනය වූ පන්ති බලවේග සංවිධානය කර ඒ වටා අධිරාජවාදයෙන් පීඩාවට පත්වූ සියලු බලවේග ගොනු කිරීමේ වගකීම වමේ ව්‍යාපාරය වෙත පැවරී ඇත. එම ක්‍රියාවලිය තුළ දී බාහිර සතුරු බලවේග සමග සටන් කිරීම මෙන්ම පක්ෂ අභ්‍යන්තරයේ මතුවිය හැකි අවස්ථාවාදී ප්‍රවණතා පරාජය කිරීමද එකසේ වැදගත්ය.

එම කර්තව්‍යය සඳහා ප්‍රථමයෙන්ම පවතින දේශපාලන තත්වය නිවැරදිව විග්‍රහ කර ගැනීමත්, එම තත්වය තුළ එක් එක් දේශපාලන බලවේගයන්ගේ භූමිකාවන් වටහා ගැනීමත් කළ යුතුය. මේ මොහොත වනාහී අප මුහුණ පා ඇති දේශපාලන අභියෝගයත් එම අභියෝග ය ඉදිරියේ ජනතා විමුක්ති පෙරමුණ විසින් ගනු ලබන උපායමාර්ගික හා උපක්‍රමිකක්‍රියාමාර්ගත් පිළිබඳ සංවාදයක් ඇති වී තිබෙන මොහොතකි. එමෙන්ම ඒ පිළිබඳව අතිශය සාවද්‍ය මත හා අවලාද පතුරුවමින් තිබෙන මොහොතකි.

මේ වනවිට සමාජය තුළ සාකච්ඡා වෙමින් පවතින ප්‍රශ්න කිහිපයක් සහ ජනතා විමුක්ති පෙරමුණේ නායක සෝමවංශ අමරසිංහ සහෝදරයාත් ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයාත් එම ප්‍රශ්න සඳහා දක්වන අදහස් මේ සමග පළවන ප්‍රශ්න උත්තර තුළ අන්තර්ගත වී ඇත. මේ වන විට ජනතා විමුක්ති පෙරමුණේ නියමුවා ප්‍රකාශන මගින් පොත් පිංචක් ලෙස එළිදක්වා මෙම ඇති කෘතියේ, සංවාදයට ලක් කෙරෙන කරුණු සන්නස පුවත් පතේ කාරුණික අනුග්‍රහය යටතේ පහත සඳහන් අනු පිළිවෙලින් පළ කෙරෙණු ඇත.

- ජ.වි.පෙ. සහ ආණ්ඩුව
- පක්ෂයේ ගමන් මග
- විදෙස් බලපෑම්
- රටේ දේශපාලනය සහ ජ.වි.පෙ.
- ඉදිරි වැඩපිළිවෙළ

ජ.වි.පෙ. සහ ආණ්ඩුව

ප්‍රශ්නය :- වත්මන් ආණ්ඩුව පිහිටුවීමට මුල් වුණේත් ජ.වි.පෙ. යි. ඒ වගේම මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති කරවීමට විශාල කර්යභාරයක් කළේත් ජ.වි.පෙ. යි. ඒත් දැන් ඔබපක්ෂය වත්මන් ආණ්ඩුවටබරපතල විවේචනයක් එල්ල කරනවා. ඒ ඇයි?

සෝමවංශ අමරසිංහ සහෝදරයා : 2001 දෙසැම්බර් සිට 2004 අප්‍රේල් දක්වා බලයේ හිටපු රනිල් වික්‍රමසිංහ මහතාගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව යටතේ ශ්‍රී ලංකාවට සිදුවෙමින් තිබුණ විපත දැන් සමහරුන්ට අමතක වී ගෙන යනවා. ඒකට හේතුව දැන් මේ රාජපක්ෂ ආණ්ඩුව යටතේදීත් රටත්, ජනතාවත් වඩා නරක තත්වයන්ට මුහුණ දෙමින් සිටීමයි. කෙසේ වෙතත් 2001 දෙසැම්බර් මාසෙ බලයට පත්වුණු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 2004අප්‍රේල් මාසය වෙනකොට, ඒ කියන්නේ ඒ ආණ්ඩුවට අවුරුදු දෙකයි මාස තුන පිරෙන තැනදී එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පත් කරන්න හේතුවූ තත්වය කෙටියෙන් කියනවා නම් මෙහෙමයි. රනිල් වික්‍රමසිංහ මහතා බලයට පත් වී කොටි සංවිධානය එක්ක ශ්‍රී ලංකාවට ඉතාම හානිකර වූ ඊනියා සටන් විරාම ගිවිසුමකට එළඹුණා. ඒ යටතේ එතෙක් නොවූ විරූ ලෙස ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව කඩාගෙන වැටුණා. ස්වෛරීභාවය, ස්වාධීනත්වය හා භෞමික අඛණ්ඩතාවය උල්ලංඝනය වුණා. රටේ උතුරු හා නැගෙනහිර පළාත් දෙක තුළ වේගයෙන් ඊළම් රාජ්‍යය ස්ථාපිත වෙමින් පැවැතුණා. එතෙක් නොවූ විරූ පරිදි ශ්‍රී ලංකාවට විදේශ අතපෙවීම් සිදුවුණා. එමගින්ද ශ්‍රී ලංකාව තුළ දෙමළ ඊළම් වෙනම රාජ්‍යය පිහිටුවීමේ ක්‍රියාදාමයට දැවැන්තපිටිවහලක් ලැබුණා.

අනික් අතට එතෙක් කලක් රට තුළ ක්‍රියාත්මක වූ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය වේගයෙන් විනාශයට පත් කෙරෙමින් තිබුණා. ඒ අතර එක්සත් ජාතික පක්ෂ පාලනය යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩපිළිවෙළ ක්‍රියාවට නැගීමට සැරසුණා. එම තත්වය තුළ ශ්‍රී ලංකාව එහි ජනතාවට යළි අත්පත් කරගැනීම වෙනුවට එය මුළුමනින්ම ජනතාවට අහිමි කර දැමීමේ විනාශකාරී ක්‍රියාදාමයකට පාත්‍ර වී තිබුණා. එනිසාම ඒ දුෂ්ට

ක්‍රියාදාමය අප්‍රමාදව නතර කළ යුතු බව අවබෝධ කරගත් ජනතා විමුක්ති පෙරමුණ ඒ අනුව ක්‍රියාත්මක වුණා. ජනතාව අතර එක්සත් ජාතික පක්ෂ පාලනයට එරෙහිව දැවැන්ත උද්ඝෝෂණයක් ගෙනගියා. ආණ්ඩුවේ දේශද්‍රෝහී, ජනතා ද්‍රෝහී කටයුතු වලට එරෙහිව ගාල්ලේ සිට කොළඹ දක්වාත්, මහනුවර සිට කොළඹ දක්වාත් විරෝධතා පා ගමන් සංවිධානය කළා. ජනතාව දැනුවත් කළා. ජනතාව බලමුළු ගැන්වුවා. එමගින් එක්සත් ජාතිකපක්ෂයේ ආණ්ඩුව විසුරුවා හරින තැනට එකල ජනාධිපති ධූරය දැරූ චන්ද්‍රිකා කුමාරණතුංගමහත්මිය රැ ගෙන ආවා. ඒ අතරතුර එක්සත් ජනතා නිදහස් සන්ධානය ගොඩනැගීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ පුරෝගාමීත්වයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ සාකච්ඡා පැවැත්වුණා.

වැඩපිළිවෙළක් සකස් කෙරුණා. ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානය බිහිකරමින් ජනතා විමුක්ති පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගිවිසුම් ගත වුණා. ඊට පසු එක්සත් ජනතා නිදහස් සන්ධානයට තවත් දේශපාලන පක්ෂ ගණනාවක්ම එකතු වුණා. 2004 අප්‍රේල් පැවැත්වුණු මහා මැතිවරණයේදි එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කරවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ දේශද්‍රෝහී, ජනතා ද්‍රෝහී වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම අවසාන කළා. එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව පිහිටුවීමේදීත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාව ප්‍රශ්නයක් ඇති කළා. සන්ධාන ගිවිසුම බිඳ දැමුවා. ඒත් ජනතා ඉල්ලීම මත එය නොසලකා ජනතා විමුක්ති පෙරමුණ, ආණ්ඩුව තුළ කටයුතු කළා. ඇමති තනතුරු බාරගෙන රට වෙනුවෙන් වැඩ කළා. නමුත් ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ප්‍රශ්නයට අදාලව සන්ධාන ගිවිසුමේ එකඟතාවයන් සාහසික ලෙස බිඳ දමන්නට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාව වුණු හිටපු ජනාධිපතිනිය සූදානම් වුණු අවස්ථාවේ එනම්, ඊනියා සුනාමි සහන මණ්ඩලය පිහිටුවා කොටි සංවිධානයට උතුරු හා නැගෙනහිර යන පළාත් දෙක පවරාදීමට කටයුතු කළ අවස්ථාවේදී ජනතා විමුක්ති පෙරමුණට ආණ්ඩුවෙන් ඉවත් වී විපක්ෂයේ අසුන්ගන්න සිදුවුණා. ඒත් අපි විපක්ෂයේ සිට ආණ්ඩුවේ සියලු ජනතා හිතවාදී පියවරවලට සහය දුන්නා. විශේෂයෙන් ත්‍රස්තවාදයට එරෙහිව යුදමය පියවර ගන්නට ආණ්ඩුවට බල කිරිමත්, එම පියවර සියල්ලම ගැනීම සඳහාකොන්දේසි විරහිතව ආණ්ඩුවට සහයෝගය දීමත් කළා. මේ මොහොතේත් කොටි ත්‍රස්තවාදයපැරදවීම සඳහා කිසිදු දෙගිඩියාවකින් තොරව ජනතා විමුක්ති පෙරමුණ ආණ්ඩුවට ඒ සහයෝගය දෙමින් ඉන්නවා. අපි සන්ධාන ආණ්ඩුවෙන් ඉවත් වී සිටියත් 2005 ජනාධිපති වරණය එළඹි අවස්ථාවේදී එවකට අගමැති ධූරය දරපු මහින්ද රාජපක්ෂ මහත්මයා සමඟ අලුත් ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ වගන්ති 13ක් තිබුණා. වගන්ති 12ක් ජනාධිපති වුණාට පස්සෙ මහින්ද රාජපක්ෂ මහතා ඉටු කළ යුතු කටයුතු පිළිබඳවයි. එක වගන්තියක් ජනතා විමුක්ති පෙරමුණ ඉටු කළ යුතුව තිබුණා. ඒ වගන්තියෙන් කියැවුණේ ජනතා විමුක්තිපෙරමුණ ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතාට ජය ගැනීම සඳහා උපරිම සහයෝගය ලබාදෙන බවයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බොහෝ නායකයෝ, අද ඇමතිධූර පවා දරන බොහෝ දෙනා මහින්ද රාජපක්ෂ මහතාට එදා සහයෝගය දීම වෙනුවට ඔහුගේ කකුලෙන් ඇද්දා. ඔහු පරාජය කරන්න කටයුතු කළා. එවැනි වටපිටාවක තමයි, අපි මහින්දරාජපක්ෂ මහතා දිනෙව්වෙ. ඒත් ජනාධිපතිවරයා ටික කලකින්ම තමන්ට ලැබුණ ජනවරම පැත්තකට දාල වැරදි දේශපාලන මඟක යන්න පටන් ගත්තා. අපේ විවේචනය එල්ල වුණේ එතැන් සිටයි. මේ වනවිට හැම ක්ෂේත්‍රයකම ආණ්ඩුව තමන්ගේ අසමත්කම පෙන්නලා ඉවරයි.

මහින්ද රාජපක්ෂ මහතා හා ඔහුගේ ආණ්ඩුව යටතේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා අනිකුත් ආරක්ෂක සේවා බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව සැලකිය යුතු ජයග්‍රහණ අත්පත් කරගෙන තිබුණත් ආණ්ඩුවේ ඉහළ සිට පහළ දක්වා වූ සියලු දෙනාම යුද පෙරමුණේ දිවි පුදන සෙබළ සෙබළියන්ටත්, ජනතාවටත්,ලබාදෙන ආදර්ශය කුමක්ද? ඔවුන් රට වෙනුවෙන් කරන පරිත්‍යාග ය කුමක්ද? වංචා, දූෂණ හා නාස්තිය පිළිබඳ නායකත්වය සපයන්නේ, ඔවුනුයි.

එසේ වුවත් ආරක්ෂක හමුදාව මෙන්ම ශ්‍රී ලංකාවේ ජනතාවත් මේ අවස්ථාවේදී ඉතා ඉහළ මට්ටමක කැපවීමක්, පරිත්‍යාගයක් කරමින් ඉන්නවා. මේ දූෂිත ආණ්ඩුව තවත් පැත්තකින් ශ්‍රී ලංකාව තුළ, ඉන්දියාවේ ආර්ථික ව්‍යාප්තවාදයටත්, දේශපාලනව්‍යාප්තවාදයටත් ඉඩ සලසා තියෙනවා. එතැනින් නැවතිලා නැහැ. ජනාධිපතිවරයාත්, ආණ්ඩුවත් පැහැදිලි ලෙසම ප්‍රජාතන්ත්‍ර විරෝධී ගමනක් යන්න අර අදිනවා. ඔහු මේ වනවිටත් තව දීර්ඝ කාලයක්බලයේ සිටීම සඳහා න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරමින් ඉන්නවා. 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක නොකර, ඒ හරහාස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවත් ස්වාධීන පොලිස් කොමිෂන් සභාවත් පිහිටුවන්නේ නැතුව පළාත් සභා ඡන්ද පවත්වනවා. පළාත් සභා ඡන්දයන් එකවර රටපුරා පවත්වනවා වෙනුවට කඩින් කඩ කොටස් වශයෙන් තමන්ට වාසිදායක වන ලෙස පැවැත්වීමට උත්සහ ගන්නවා.

ආණ්ඩුවේ අයවැයෙන් 70%ක් පමණ පාලනය කරන්නෙත් ජනාධිපතිවරයා ඇතුළු ඔහුගේම සහෝදරවරුයි. එසේ කිරීමෙන් මේ රටට, ජනතාවට සෙතක් වෙනවා නම් ඒක බරපතල ප්‍රශ්නයක් නෙවෙයි. නමුත් ඒ වෙනුවට දූෂණය, නාස්තිය මේ තැන්වල රජ කරනවා.

ජනාධිපතිවරයා පැහැදිලි ලෙසම ඥාති මිත්‍ර ගණයාගේ" පාලනයක් ශ්‍රී ලංකාවේ ජනතාව මතපටවා තිබෙනවා. ඒ සඳහා මහජන මුදල් වගේම බලයත් වරිගයා අත එක්රැස් කර තිබෙනවා. ඉතින් මේ පෙන්වන ලක්ෂණ අනුව ජනාධිපතිවරයා මාකෝස්" පන්නයේ ඒකාධිපතිපාලනයක් ස්ථාපිත කරන්න කටයුතු කරමින් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ, මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ ජනාධිපති ධූරයේ වඩා හිඳෙව්වේ" ශ්‍රී ලංකාව හැම අතින්ම පෙරට ගෙනියන්න මිස අපේ මව්බිම ඉන්දියාවේ ප්‍රාන්තයක් බවට පත් කිරීමට හෝ අපේ මව්බිම ආර්ථික වශයෙන් හපයක් බවට පත්කරන්න හෝ නෙවෙයි. රටේ ආර්ථිකයේ බර විවිධ බදු පනවමින් ජනතාව මත පටවන්න නෙවෙයි. ජනතාව බදු බර දරාගෙන දුක් විඳිද්දී මහජන මුදල් කෝටි ගණන් නාස්ති කරන්න නොවෙයි. ආණ්ඩුවේ මේ දුෂ්ට, දේශද්‍රෝහී, ජනතා ද්‍රෝහී දේශපාලන න්‍යාය පත්‍රය කොන්දේසි විරහිතව පරාජය කළ යුතුයි. ජනතා විමුක්ති පෙරමුණට හැර මේවගකීම වෙනත් පක්ෂයකට ඉටු කළ නොහැකියි.

ප්‍රශ්නය :- ඔබේ පක්ෂයේ ආණ්ඩු විරෝධී කටයුතු නිසා එ.ජා.ප.යට හා එල්.ටී.ටී.ඊ.යට වාසිලැබෙන බවත් ඔබ පක්ෂය අනියමින් එ.ජා.ප.යට හා එල්.ටී.ටී.ඊ.යට උදව් කරන බවටත් සමහරු චෝදනා කරනවා. ඒ ගැන ඔබ කියන්නේ කුමක්ද?

ටිල්වින් සිල්වා සහෝදරයා :- වර්තමාන ආණ්ඩුවත්, ආණ්ඩුව වෙනුවෙන් බැළමෙහෙවරකම් කරන සමහර කල්ලිත් මෙවැනි අවලාදයක් නඟන බව ඇත්ත. ඉන් පෙන්නුම් කරන්නේ, ඔවුන්ගේ තිබෙන දේශපාලන බංකොලොත් කමයි. අපි අනියමින් එක්සත් ජාතික පක්ෂයට උදව්කරන බවට අභූත චෝදනා නගන්නේ කවුද? දැනටමත් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල නායකයන් 24ක් තම ඇමති මණ්ඩලයේ තියාගෙන එක්සත් ජාතික පක්ෂයේ පිහිටෙන් මේ රට පාලනය කරන ආණ්ඩුව නේද? ජනතා විමුක්ති පෙරමුණේ අපි අපේ ඉතිහාසයේ කිසිම දිනක එක්සත් ජාතික පක්ෂයට උදව් කර නැහැ. එක්සත් ජාතිකපක්ෂය සමඟ එකට වැඩ කරල නැහැ. ඒ එක්සත් ජාතික පක්ෂය සමඟ තිබෙන පෞද්ගලික අමනාපයක් නිසා නොවෙයි. ඔවුන්ගේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අපේ මව්බිමට හා ජනතාවට හානිකර වූ ඒවා නිසා. ඒත් එක්සත් ජාතික පක්ෂයේ සහායෙන් රට පාලනය කරන මේ ආණ්ඩුවම තමයිපසුගිය අවුරුද්දේ පළාත් සභා කිහිපයකම අයවැය සම්මත කරගන්න එක්සත් ජාතික පක්ෂයේ සහය ගත්තේ. පසුගිය දිනක උතුරුමැද පළාත් සභාවේ හිටපු මහ ඇමති බර්ටි ප්‍රේමලාල් දිසානායක මහතා කිව්වේ, පසුගිය පළාත් සභා අයවැයට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වුණු වෙලාවේ අයවැය සම්මත කරගත්තේ උතුරුමැද පළාත් සභාවේ එවකට විපක්ෂ නායකතුමාට (එ.ජා.ප) මොන්ටේරෝ රථ යක් ලබාදීලා එ.ජා.ප.යේ සහයෝගය අරගෙනයි කියලා. ඉතිං එලෙස කටයුතු කරපු ආණ්ඩුව තමයි, අපිට අවලාද නඟන්නෙ.

*ලබන කලාපයට*

**ජනතා විමුක්ති පෙරමුණ,**
**ජාත්‍යන්තර අංශය,**
**ඔස්ට්‍රේලියාව**